චක්‍රලේඛ අංක :- 20/95

මගේ අංකය :- දපස/නීති/චක්‍ර
සමුපකාර සේවක කොමිෂන් සභාව (ද.ප.),
අංක 07, බාලදක්ෂ මාවත,
ගාල්ල. 1995.11.07

දකුණු පළාතේ සියළුම සමුපකාර සමිතිවල,
සභාපතිවරුන් වෙත.

## සමුපකාර සමිතිවල තනතුරු සඳහා පත් කිරීම.

1981.12.01 දිනැති අංක 169/8 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාවේ 18 වන නියෝගය වෙනුවට, 1994.12.13 දින අංක 849/7 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පහත සඳහන් නියෝගය ආදේශ කර ඇත.

> " 18, සමිතිය විසින් සියළුම ස්ථිර පත් කිරීම් කළ යුත්තේ එම කාර්යය සඳහා පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක නිර්දේශයන් සළකා බැලීමෙන් පසුවය. එසේ තනතුරකට පත් කිරීමට පෙර එසේ පත් කරනු ලබන පුද්ගලයාගේ සුදුසුකම් ද වෙනත් අදාල විස්තර ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එම පත් කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. "

02. මේ අනුව කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 1985.06.19 දිනැති අංක 135/85 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර, සමුපකාර සමිතිවල සියළුම තනතුරු වල පුරප්පාඩු පිරවීමට අදාලව ඉහත කී කොමිෂන් සභා රෙගුලාසි අංක 18 අනුව කටයුතු කර, 73.03.08 දිනැති අංක 11/73 දරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි ලිපි ගොනුව නොපමාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර, තෝරා ගත් අයදුම්කරු පත් කිරීමට කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව දන්වමි. මෙම නියෝගය පොරොත්තු ලේඛනයක සිටින අයදුම්කරුවන්ට ද එම ආකාරයෙන්ම බලපවත්වන බව සැළකිය යුතුය.

03. තනතුරු වලට පත්කර, අනතුරුව කොමිෂන් සභාවෙන් අනුමැතිය ඉල්ලා නොසිටිය යුතු අතර, විධිමත් අනුමැතිය නොමැති පත්වීම් බල රහිත වන බැවින් ඒවා අවලංගු කිරීමට කටයුතු කළ යුතු වේ. තවද එවැනි පත්වීම් ලද පුද්ගලයන්ට ගෙවන ලද වැටුප හා දීමනා අධ්‍යක්ෂ මණ්ඩලයට අධිභාර කිරීමට ස.සං.කො/රෙ වෙත නිර්දේශ කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ඇත.

04. ඉහත කී සංශෝධනය ඇතුලත් ගැසට් පත්‍රයේ රෝනියෝ පිටපතක් දැනටමත් මාගේ 95.04.19 දිනැති අංක 18/95 චක්‍රලේඛනය මගින් ඔබ වෙත එවා ඇති බව සිහිපත් කරවමි.

05. මෙම චක්‍රලේඛනය දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේද එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

ලේකම්,
දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

පිටපත් :- 1. ආ.ස.ලේ. - ද.ප.
2. ස.සං.කො/රෙ - ද.ප.
3. ලේකම්, ස.සේ.කො.ස. - කොළඹ.
4. සියළුම පළාත් කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.
5. දකුණු පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.